CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ශ්‍රී ලංකාවේ වත්මන් අර්බුධය සහ වර්තමාන රෙජීමය ඉවත්කල යුතු බවට වන මහජන උද්ඝෝෂණය පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

**4th April 2022, Colombo, Sri Lanka**: මින්පෙර නොවූවිරූ ලෙස වත්මන් අර්බුදයට හේතුව අයහපාලනය බව සහ අර්බුදය නිරාකරණය කිරීම පිණිස රජයේ විශ්වසනීයත්වය සහ සුජාතභාවය සමග ආණ්ඩුකරණයේ මූලික ආයතන නැවත ස්ථාපනය කිරීම සහ ශක්තිමත් කිරීම කලයුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩිලෙස විශ්වාස කරයි. රටපුරා පැතිරුණු, සාමකාමි ලෙස සිදුවන, ජනතා බලාපොරොත්තු සුන්වීම, පිටාරගැලීම හමුවේ විසම්මුතිය මර්ධනය කිරීම අරමුණුකොටගත් රෙජීමයේ උත්සාහයන් පැහැදිලි ලෙසම අසාර්ථක වී ඇත. ජනාධිපතිවරයා සහ රෙජීමය ඉවත්විය යුතු බවට වන පණිවිඩය පැහැදිලිව හා උස් හඬින් ඇසේ.

නායකත්වය ශක්තිමත් ලෙස සුරක්ෂිත කරනු ලබන්නේ නායකත්වය දෙනු ලබන්නන්ගේ සුජාතභාවය සහ විශ්වසනීයත්වය විසින් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශ්වාස කරයි. බිය සහ ආරක්ෂාකාරී හැසිරීම්, ජනතාවගේ දුෂ්කරතාවයන් සහ වේදනාවන් පිලිබඳ හැඟීම් විරහිත නොසලකාහැරීම්, සුපිරි මට්ටමේ වන අදක්ෂකම්, පැහැදිලිව පෙනීයන විශේෂඥතාවයන් නොමැතිකම සහ සියල්ල වසා පැතිර පවත්නා බලයේ සිටින්නන්ගේ පාලනය කරගත නොහැකි තන්හාව යනාදිය මගින් ආණ්ඩුව සහ ආණ්ඩුකරණය දිගටම කරගෙන යා නොහැකිය. වෙනස සිදුවිය යුතුමය. දඬුවම් නොලබා වරද කිරීමේ සංස්කෘතිය කිසිසේත්ම පැවතිය යුතු නොවේ. ජනතාවගේ දැඩි අවශ්‍යතාවය මෙන්ම ඔවුන් ඉල්ලා සිටින්නේ ද එයමය.

කිසිඳු ප්‍රමාදයකින් තොරව ජනතා හඬට කන්දෙන ලෙසත් ඒ අනුව ක්‍රියාකරන ලෙසත් අපි පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටින්නෙමු. සමස්ත රාජපක්ෂ රෙජීමයම ඉල්ලා අස්විය යුතු අතර, විධායක ජනාධිපති ධූරය අහෝසි කළ යුතුය. විධායක ජනාධිපති ධූරය ලංකාවේ ආණ්ඩුකරණයට

ඇති විශාලම බාධකය වේ. එමගින් මුළු රටම දනගැස්වීමට රාජපක්ෂ රෙජීමයට ඉඩකඩ සලසා දී ඇත.

ඒ සමගම, විරුද්ධ මත ප්‍රකාශ කිරීමට, නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට හා නිදහසේ සමාගම් පැවැත්වීමට ජනතාව සතු වූ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කිරීම් අහෝසි කල යුතු අතර එසේ සිදු වූ උල්ලංඝනය කිරීම් පිළිබඳව පූර්ණ විමර්ශනයක් සිදුකොට ඒවාට වගකිවයුත්තන් සම්බන්දයෙන් නීතියට අනුව ක්‍රියාකළ යුතුය. රටේ නීතිය සියල්ලන් විසින් පිලිපැදිය යුතු වන අතර බියෙන් හෝ පක්ෂපාතීත්වයෙන් තොරව එය ක්‍රියාත්මක කල යුතුය.

තත්ත්වය යහපත් අතට හැරීමට පෙර නිසැකවම සිදුවනු ඇත්තේ තවත් නරක අතට හැරීමයි. කෙසේ නමුත් මෙම තත්වය විශ්වසනීයත්වයකින් යුතුව ජනතාවට සන්නිවේදනය කරන්නේනම් හා යථාතත්වයට පත්කිරීම ආරම්භ කිරීමේ නිශ්චිත පියවරයන් ක්‍රියාකාරීත්වය මගින් පැහැදිලිව පෙන්නුම් කරන්නේනම් ජනතාව මෙම තත්වය අවබෝධ කරගනු ඇත.